# 20 රාජ්‍ය පාලනය හා සදාචාරය

බුදුරජාණන් වහන්සේගේ දේශනා මඟින් ප්‍රකට කෙරෙන පරිදි, රටක දේශපාලනය, ආර්ථිකය හා සදාචාරය, එකිනෙක හා බැඳී පවතියි. මෙම අංශ තුන රාජ්‍ය පාලකයා විසින් දැහැමි ව හා විධිමත් ව සංවිධානය කොට මෙහෙයවීම අවශ්‍ය ය. එ සේ වූ විට පමණක් රටක ප්‍රජාව සුඛිත මුදිත කළ හැකි ය. එ සේ නොවුවහොත් රට අන්ත පරිහානියකට පත් ව ප්‍රජාව විවිධ දුෂ්කරතාවලට ලක් වීම නොවැළැක්විය හැකි ය.

## රාජ්‍ය පාලනය

බුදුදහමේ පෙන්වා දෙන මහා සම්මත සංකල්පයට අනුව ප්‍රථම රාජ්‍ය පාලකයා මහජනතාව අතුරෙන් පත් කර ගන්නා ලදී. ජනතාව සමඟ ඇති කරගන්නා සම්මුතියකට අනුව හෙතෙම පාලනය සඳහා පත් ව සිටියි. එම වගකීම ඉටු නොකරන්නේ නම් හෙතෙම පාලනයෙන් ඉවත් විය යුතු ය. කවර මට්ටමක පාලනයක් භාරව ක්‍රියා කරන්නකු සම්බන්ධයෙන් වුව ද මෙම වගකීම හා වගවීම එක සේ සාධාරණ ය.

රටක් පාලනය කරන්නා ගුණ වගාවක් ඇති පුද්ගලයකු විය යුතු අතර තම ජනතාව වෙනුවෙන්, තමන්ගේ ඥානය, ශ්‍රමය හා කාලය කැප කරන්නකු විය යුතු ය. පාලකයාගේ චරිතයෙහි තිබිය යුතු සුවිශේෂත්වය පෙන්වා දෙන බුදුදහම ආධ්‍යාත්මික ශික්ෂණයකින් යුත් කාර්ය ශූර අයකු විය යුතු බව ද අවධාරණය කරයි. පාලකයා හැම විට ම තමාගේ යහපත ගැන සිතීමට පෙර පොදු ජනතාවගේ යහපත ගැන සිතිය යුතු ය. එ වැනි පරාර්ථකාමිත්වයක් ඇති තැනැත්තෙක් ම විශිෂ්ට පාලකයෙක් වෙයි.

අදක්ෂ අදූරදර්ශී පාලනය නිසා රටක ආර්ථිකය පිරිහී ඒ අනුව සදාචාරය බිඳ වැටෙන අන්දමත්, දක්ෂ, දූරදර්ශී පාලනය නිසා ජනතාව සමෘද්ධිමත් ව සදාචාරවත් රටක් ගොඩනැගෙන අන්දමත් ප්‍රකට කෙරෙන කතා පුවත් දෙකක් පිළිබඳ ව විමසා බලමු. පැරණි දඹදිව දල්හනේමි නම් සක්විති රජ කෙනකු රාජ්‍ය කරන කාලයෙහි,

> රාජ්‍ය සේවකයෝ රජු හමුවට සොරකු ගෙන ආහ. "ඔබ සොරකම් කළා ද යි" සොරාගෙන් රජ විමසී ය.
>
> "එ සේ ය දේවයන් වහන්ස" සොරා පිළිතුරු දුන්නේ ය.
>
> "ඔබ සොරකම් කළේ ඇයි ද " යි රජතුමා විමසී ය. ජීවත් වීමට ක්‍රමයක් නැති නිසා ය යන්න සොරාගේ පිළිතුර විය.
>
> රජතුමා මුදල් පොදියක් ගෙන්වා සොරාට දී, මෙ සේ ද අවවාද කළේ ය.

"මෙම මුදල් රැගෙන ගොස් ඔබ ජීවත්වන්න, මව්පියන් ද අඹු දරුවන් ද පෝෂණය කරන්න. කර්මාන්තයක් ද පටන්ගන්න".

මින් පසුව ද කීප අවස්ථාවක දී රාජ්‍ය සේවකයෝ රජු වෙතට සොරුන් ඉදිරිපත් කළහ. එම සොරුන්ට ද රජුගෙන් පළමු පරිදි ම සංග්‍රහ ලැබිණි. රජතුමා සොරුන්ට මුදලින් සංග්‍රහ කරන්නේ ය යන ආරංචිය රට පුරා පැතිර ගියේ ය. එයින් තව තවත් සොරකම පැතිරගිය බැවින්, තමා ගත් ක්‍රියාමාර්ගය වැරදුණ බව රජුට වැටහිණි. එම සොරුන්ට දඬුවම් පැමිණවීමටත්, හිස ගසා දැමීමටත් රජුගෙන් රාජ්‍ය සේවකයන්ට අණ ලැබිණ. රජු දඬුවම් කරනබව දැන ගත් සොරු, කණ්ඩායම් සැදී අවි ආයුධ අතට ගත්හ. වස්තු හිමියන් මරණයට පත් කළහ, මං පැහැරූහ, මංකොල්ල කෑමට පටන් ගත්හ. රට පුරා අරගල පැතිර ගියේ ය.

**චක්කවත්ති සීහනාද** සූත්‍රයෙහි සඳහන් වන අන්දමට දල්හනේමි රජ පරපුරේ අටවැන්නා වූ මෙම රජතුමා පාලනය භාර ගත් පසු චක්‍රරත්නය අතුරුදන් විය. ඒ පිළිබඳ ව ඔහු අසතුටට පත් වූ අතර එයට හේතු විමසා බලා ඊට පෙර රජවරුන් අනුගමනය කළ ප්‍රතිපත්තියෙහි නො යෙදුණේ ය. තම හිතුමතයට රට පාලනය කිරීමේ ප්‍රතිඵලය වූයේ පෙර රජුන් දවස මෙන් රට සමෘද්ධිමත් නො වීම ය. ක්‍රමයෙන් පාලනය පිරිහෙන විට රජයේ නිලධරයෝ එකතු වී ඒ බව රජුට දැන්වූහ. මේ තත්ත්වය ගැන අවධානය යොමු කරන ලෙස ද ඉල්ලා සිටියහ. රජු ඔවුන්ගේ උපදෙස් ලබා ගත් නමුත් ඒවා එලෙස ම ක්‍රියාවට නැංවූයේ නැත.

දිළින්දන්ට ධනය නොදෙන විට දිළිඳුකම වැඩි විය. දිළිඳුකම වැඩි වන විට සොරකම ද වැඩි විය. සොරකම පැතිරගිය පසු, අවි ආයුධ දැරීම පැතිර ගියේ ය. අවි දැරීම පැතිර යාම නිසා ප්‍රාණඝාතය වැඩි විය. ප්‍රාණඝාතය වැඩි වත්ම මිනිස්සු බොරු කීමට පටන් ගත්හ. පසුව එකිනෙකා බිඳවන කේලාම් පැතිර යන්නට විය. කාමයෙහි වරදවා හැසිරීමට ද මිනිස්සු පෙළඹුණහ. මෙ සේ ක්‍රමයෙන් සිත් රිදවන කථා බහ, පරුෂ වචන , ප්‍රලාප වැඩි විය. අනතුරුව දැඩිලෝභය, ද්වේෂය, ව්‍යාපාදය පැතිර ගියේ ය. මේ නිසා ම වැරදි අදහස් පැතිර ගියේ ය. මේ තත්ත්වයට රට පත්වන විට මව, සුළු මව, නැන්දම්මා ආදි නෑදෑකම් පවා නොසලකන තත්ත්වයට පත් ව දුරාචාරය පැතිර ගියේ ය. මිනිස්සු ආයුෂයෙන් ද, වර්ණයෙන් ද පිරිහීමට පත් වූහ. මවට, පියාට, මහණ බමුණන්ට, වැඩිහිටියන්ට ගරු කිරීම, සැලකීම නැත්තට ම නැතිවී ගියේ ය. සදාචාරය අන්තයට ම පිරිහිණි.

ඉහත සඳහන් කළ දල්හනේමි රජතුමාගේ රට මෙන් ම අරගලකාරී තත්ත්වයට පත් ව තිබුණ තවත් රටක පාලකයෙකි, මහාවිජිත රජතුමා. එම රජතුමා තමාගේ රටෙහි සමෘද්ධිය තවත් දිගුකලක් පවත්වා ගැනීම පිණිස මහා යාගයක් කිරීමට අදහස් කළේ ය. ඒ පිළිබඳ ව පුරෝහිත බමුණාගෙන් කරුණු විමසූ විට ඔහු රජතුමාට දුන් පිළිතුර මෙයයි.

"රජතුමනි, දැන් රට තුළ විවිධ නීති විරෝධී ක්‍රියා පැතිර ගොස් අවුලෙන් අවුලට පත් වී තිබෙනවා, මෙ වැනි තත්ත්වයක් යටතේ ඔබේ යුතුකම් ඉටු නොකර යාග කිරීමට හෝ රට වැසියන්ගෙන් බදු අය කරන්නට සිතනවා නම් එය අසාධාරණ යි.

එ මෙන් ම මේ සොරුන් සහ අරගල කරන අය බලය යොදවා වනසා දැමීමට සිතුවොත්, එය ද අසාර්ථක පියවරක්. දමරිකයන් කොටසක් මරා දැමුවත් තවත් ඉතිරි වන අය සිටිනවා. ඔවුන් නැවතත් අරගල කරනවා. එ නිසා කළ යුත්තේ සංවිධානාත්මක ලෙස ආර්ථික සංවර්ධනයක් ඇති කිරීම යි. එ විට රට සමෘද්ධියට පත් වෙයි."

රජතුමාගේ විමසීම අනුව, ක්‍රියාත්මක කළයුතු වැඩ පිළිවෙළ පිළිබඳ ව ද පුරෝහිත බමුණා මෙසේ විස්තර කළේ ය.

1. රජතුමනි, රටේ ගොවිතැන් කටයුතුවල මෙන් ම ගව රක්ෂණයෙහි යෙදී සිටින අයට ඒ සඳහා අවශ්‍ය වන දෑ සපයන්න. බීජ, ධාන්‍ය, පොහොර, නඟුල්, ගවයින් ලබා දෙන්න. අස්වනු ලැබෙන තෙක් ආහාර පාන ලබා දෙන්න.

2. රටේ වෙළෙඳාම් කිරීමෙහි නිරත වන අය සිටිනවා, ඔවුනට මූලික වශයෙන් අවශ්‍ය වන දෑ (ප්‍රාග්ධනය) ලබා දෙන්න.

3. රාජ්‍ය සේවය තුළ සුදුස්සන් නිසි තැන්වල පිහිටුවා ඔවුනට වැටුප් හා ආහාරපාන ලබා දෙන්න. එවිට එක් එක් පුද්ගලයා තම තමන් කැමති හා දක්ෂතා දක්වන රැකියාවල නිරත වී ධනය උපයා ගනීවි. ජනතාවගෙන් බදු අය කර ගැනීමට ද හැකි වන නිසා රාජ්‍ය භාණ්ඩාගාරය ද පිරේවි. හැම කෙනෙක් ම රැකියාවල නිරත වන නිසා නිකරුණේ කාලය ගෙවමින් අරගලවල යෙදීමට ඇති අවස්ථාව නැති ව යාවී. රට අපරාධවලින් තොර සාමකාමී එකක් වේවි. සොර සතුරු බියක් ද නැති නිසා මිනිසුන් අඹු දරුවන් සමග සතුටින් සහනයෙන් ජීවත් වේවි. පවුල් ජීවිතය ආරක්ෂා වී රට තුළ සමෘද්ධිමත් යුගයක් නැවතත් උදා වේවි.

**මහාවිජිත** රජතුමා පුරෝහිත බමුණා ගේ උපදේශයට මැනවින් සවන් දී, එය සම්පූර්ණයෙන් ම ක්‍රියාවට නැංවී ය. බලාපොරොත්තු වූ පරිදි ම යළිත් රට සමෘද්ධිමත් විය. ඒ අනුව සදාචාරය ද ගොඩ නැගිණි.

මෙම කතා පුවත් දෙකෙන් ම අපට පෙන්වා දෙන කරුණ නම් රටක, පාලනය පිරිහී යන විට ආර්ථිකය ද පිරිහේ. ආර්ථිකය පිරිහී යන විට සොරකම් ආදී දුසිරිත් ද බහුල වේ. එසේ ම රට පාලනය ක්‍රමවත් වන විට ආර්ථිකය දියුණු වේ. එ විට සොරකම් ආදී දුසිරිත් පහව ගොස් නීතිය, සාමය, සදාචාරය තහවුරු වේ යන්න යි.

මුල් කතා පුවතෙහි සඳහන් වූ දල්හනේමි රජතුමා පෙර රජවරුන් මෙන් පාලනයෙහි ලා උගතුන්ගෙන් උපදෙස් ලබාගන්නට නො සිතුවේ ය. අත්තනෝමතික ව රට පාලනය කළේ ය. එහි ප්‍රතිඵලය වූයේ පෙර රජ දවස මෙන් රට සමෘද්ධිමත් නොවීම ය. හෙතෙම නිලධාරීන්ගේ දැනුම් දීම නිසා ඔවුන්ගෙන් උපදෙස් පැතු නමුත් එම උපදෙස් සැලකිලිමත් ව ක්‍රියාත්මක නොකළේ ය. නිර්ධනීන්ට හෙවත් දුප්පතුන්ට ධනය නො දුන්නේ ය. එයින් දිළිඳුකම තව දුරටත් වැඩි විය. රටේ නිෂ්පාදනය ඇණ හිටියේ ය. විරැකියාව ඇතිවිය.

මූලික අවශ්‍යතා සපුරා ගැනීමට ජනතාවට නොහැකි විය. එ නිසා ජනතාව සොරකමට පෙළඹිණ.

රජතුමා, ප්‍රශ්නය තේරුම් ගෙන ආර්ථිකය දියුණු කළේ නම්, මෙය ගැටලුවක් නො වේ. එහෙත් රජතුමාගේ විසඳුම අසාර්ථක වූ නිසාත් පාලන ධර්ම නොදත් අයකු ලෙස දඬුවම් දී ප්‍රශ්නය විසඳීමට ක්‍රියා කළ නිසාත්, තම රටවැසියන්ගේ ජීවිත පිළිබඳ ව රජතුමා තැකීමක් නොකරන බව පෙනී ගිය නිසාත්, මිනිස්සු ආයුධ අතට ගත්හ. රංචු ගැසී මංකොල්ල කෑහ. ප්‍රශ්නය තව තවත් අවුල් වී ගියේය. සදාචාරය පිරිහී ගියේ ය. නීතිය සාමය බිඳ වැටිණි.

දෙවන කතාවේ සඳහන් මහා විජිත රජතුමා රටේ පැවති, අසහනකාරී තත්ත්වය නො දුන, තමාගේ පාලන බලය රැක ගැනීම පිණිස පළමුව යාග කිරීමට අදහස් කළත්, පුරෝහිත බමුණා ගේ බසට අහුම්කන් දී ඉහත සඳහන් කළ සංවර්ධන ක්‍රියාමාර්ග තුන අනුගමනය කළේ ය.

අසරණ නිර්ධන ජන කොටස් තෝරා ඔවුනට ධනය දීමෙන් පමණක් රටේ ආර්ථික ප්‍රශ්නයට විසඳුම් සෙවිය නො හැකි ය. නිෂ්පාදනය දියුණු කිරීමෙන්, දිළිඳුකම ද, එයින් දුසිරිත් හා අපරාධ ද නැති වන අන්දමට පාලකයින් ක්‍රියා කළ යුතු ය. දෙවන කතාවේ සඳහන් වූ **මහාවිජිත** රජතුමා අනුගමනය කළේ එම පිළිවෙත යි.

## රාජ්‍ය පාලනය පිළිබඳ බෞද්ධ ප්‍රතිපත්ති

- සක්විති වත්,
- අපරිහානීය ධර්ම,
- පන්සිල්,
- දසරාජ ධර්ම,
- සතර සංග්‍රහ වස්තු,
- සතර බ්‍රහ්ම විහරණ,
- සතර අගතියෙන් වෙන්වීම යන රාජ්‍ය පාලන පිළිවෙත් රැසක් දක්නට ඇත.

සක්විති වත් හා අපරිහානීය ධර්ම නමින් හැඳින්වෙන පාලන ධර්ම පද්ධතිය මෙහි ලා විශේෂයෙන් වැදගත් වෙයි. ප්‍රබුද්ධ පාලන ක්‍රමයක තිබිය යුතු මූලධර්ම සියල්ල ම පාහේ මෙම ඉගැන්වීම්වල අන්තර්ගත වෙයි. මෙම සියලු බෞද්ධ රාජ්‍ය පාලන ප්‍රතිපත්ති ප්‍රධාන තේමා පහක් යටතේ සංග්‍රහ කර දැක්විය හැකි ය.

1. තිරිසන් සතුන් ද ඇතුළුව රටවැසි සියල්ලන්ට ම රැකවරණය සැලසීම
2. රටේ සිදු වන අපරාධ නවත්වා සාමය පවත්වාගෙන යාම
3. මනා ආර්ථික සංවිධානයක් ගොඩ නංවා ක්‍රියාත්මක කිරීම
4. නිශ්චිත ආගමික හා සංස්කෘතික ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම
5. අත්තනෝමතික නො වී, විශේෂඥ උපදෙස් ඇති ව, ජනතාවගේ අදහස්වලට ද සවන් දී පාලනය කිරීම

## 1. සියලුදෙනාගේ රැකවරණය

රක්ෂාවරණය සැලසීම යන්නෙහි පුළුල් අරුතක් තිබේ. ජීවිතය රැක ගැනීමට අවශ්‍ය වන ආහාරපාන, ඇඳුම් පැළඳුම් සැපයීම මෙන් ම, ආපද, ගැටුම්, යුද්ධ ආක්‍රමණ යනාදියෙන් ආරක්ෂා කර ගැනීම එහි ලා අපේක්ෂා කෙරේ. එ මෙන් ම මෙහි දී ජාති, ආගම්, කුල ආදී කිසිදු භේදයකින් තොර ව සැමට එක සේ රැකවරණය සැලසිය යුතු ය. පාලක පක්ෂය ඡන්ද, දෝස, භය, මෝහ යන සතර අගතියෙන් තොර ව ක්‍රියා කළ යුතු ය. එ මෙන් ම හුදෙක් මිනිස් ප්‍රජාව පමණක් නොව, පොළවෙහි වසන හා අහසෙහි පියාසර කරන සියලු සත්ත්ව වර්ගයාගේ ම ආරක්ෂාව මෙයින් අවධාරණය කෙරේ. පොදුවේ ගත් විට සත්ව ප්‍රජාව පමණක් නොව ශාක පද්ධතිය ඇතුළු සමස්ත පරිසරය සංරක්ෂණය පිළිබඳව ම බුදුසමය සැලකිල්ල යොමු කර ඇත.

## 2. අපරාධ මර්ධනය

රටේ සිදු වන අපරාධ නැති කළ යුතු බවත්, සාමය පවත්වා ගෙන යා යුතු බවත් සක්විතිවත් හි සඳහන් වෙයි. මෙහි අපරාධ යන්නෙහි පුළුල් අරුතක් ඇත. මිනිස් ජීවිත පවත්වාගෙන යාමට එරෙහි ව එල්ලවන හිංසනය, පීඩනය හා තර්ජන ආදිය මෙන් ම, සුරක්ෂිත පවුල් ජීවිතයක් ගත කිරීමට ඇති බාධා, සත්‍යය වසන් කෙරෙන, රැවටීම් වංචනික ක්‍රියා, පොදු හා පෞද්ගලික දේපළ පරිහරණයට එරෙහි වන ක්‍රියා, හොඳ සිහියෙන් කටයුතු කිරීමට ඇති ඉඩ අහුරාලන, මත් වතුර හා මත්ද්‍රව්‍ය භාවිතයෙන් සිදු වන අවැඩ මෙහිලා අර්ථවත් වේ. පොදුවේ ගත් විට **පස්පව් හා දසඅකුසල් ම** මෙහි අපරාධ යන්නෙන් අදහස් කෙරේ

## 3. ආර්ථික සමෘද්ධිය

ජනහිතකාමී ආර්ථික සංවිධානයක් ගොඩ නැංවීම සක්විතිවත් හි තුන්වැනි ප්‍රධාන ප්‍රතිපත්තිය යි. එ වැනි ප්‍රතිපත්තියක් සැලසුම් කිරීමේ දී සැලකිල්ලට ගත යුතු මූලධර්ම පිළිබඳ ව ද කූටදන්ත සූත්‍රයෙහි සඳහන් වෙයි. විශේෂයෙන් රජය සමස්ත ආර්ථිකය ම සංවිධානය කර ගත යුතු අන්දම එහි විස්තර වෙයි. එහි දැක්වෙන මූලිකාංග කිහිපයක් මෙ සේ පෙළ ගැස්විය හැකි ය.

- රැකියා කළ හැකි සැමට රැකියා සපයන වැඩ පිළිවෙළක් රජය විසින් සැකසිය යුතු ය
- ඒ ඒ පුද්ගලයාගේ දක්ෂතා, සුදුසුකම් මෙන් ම රුචි අරුචිකම් ද සැලකිල්ලට ගෙන, ආර්ථිකයට උපරිම දායකත්වයක් ලබා දීමට හැකි වන සේ ඔවුනට ඉඩ ප්‍රස්ථා සැලසිය යුතු ය
- කෘෂි කර්මය කෙරෙහි උනන්දු වන අයට, ඒ සඳහා අවශ්‍ය බීජ, කෘෂි උපකරණ, ජලය, පොහොර ආදිය ලබා දිය යුතු ය
- ව්‍යාපාරික ප්‍රජාවට මූලධනය මෙන් ම ණය පහසුකම් ද සැපයිය යුතු ය
- රාජ්‍ය අංශය ශක්තිමත් ව ගොඩ නැගිය යුතු අතර රාජ්‍ය සේවකයින්ගේ අයිතිවාසිකම් ලබා දීමට ක්‍රියා කළ යුතු ය
- සාධාරණ බදු ක්‍රමයක් ක්‍රියාත්මක කළ යුතු ය

## 4. ආගමික හා සංස්කෘතික සංවර්ධනය

සක්විති වත්වල දක්වෙන සතරවැනි වගන්තියෙන් හා අපරිහානීය ධර්මවල එන හයවැනි හත්වැනි වගන්තිවලින් ද අවධාරණය කෙරෙන්නේ යහපත් රජයක තිබිය යුතු ආගමික හා සංස්කෘතික ප්‍රතිපත්තිය යි.

ආධ්‍යාත්මික ගුණවලින් ද යහපත් හැසිරීමෙන් ද යුත් පූජ්‍ය, පූජක පිරිසක් රටක සිටිති. රාජ්‍ය පාලකයින් ඔවුන් වෙත ගොස් කළ යුතු, නොකළ යුතු දේ පිළිබඳ ව විමසිය යුතු ය. එසේ ම එම ආගමික උතුමන් රක්ෂණය හා පෝෂණය කළ යුතු ය. එම උතුමන්ට නිසි පරිදි පුද සිරිත් පැවැත්වීමට අවශ්‍ය කටයුතු ද සැලැස්විය යුතු ය. කාගේත් ජීවිත හා දේපළ සුරකිමින් දුසිරිත් වළක්වා මනා සිහි නුවණින් ක්‍රියා කිරීමට යොමු කළ යුතු ය. එ විට සංස්කෘතිය, සාමය හා නීතිය ද සුරක්ෂිත වනු ඇත.

## 5. අත්තනෝමතික නොවීම

බෞද්ධ ඉගැන්වීම්වලට අදළව මෙතෙක් දක්වන ලද කරුණු අනුව යහපත් පාලනයක් බිහිවීමට නම් ප්‍රජාතාන්ත්‍රික වූ ද සමාජවාදී වූ ද පාලන මූලධර්ම අනුගමනය කිරීම අත්‍යවශ්‍ය ය. ඒ අනුව රාජ්‍ය පාලකයින් අත්තනෝමතික නොවී, විශේෂඥ උපදෙස්වලට සවන් දී, සාකච්ඡා මගින් යම් යම් තීරණ ගෙන ඒවා ක්‍රියාවට නැංවිය යුතු ය. අලුත් නීති පැනවීමට වඩා පනවා ඇති වැදගත් නීති ඒ අන්දමින් ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතු ය.

මෙතෙක් සාකච්ඡා කළ කරුණු අනුව, පැහැදිලි වන්නේ පාලනය, ආර්ථිකය හා සදාචාරය අතර අන්‍යෝන්‍ය සබඳතාවක් පවතිනබව යි. එම සබඳතාව තේරුම් ගෙන ක්‍රියා කිරීමෙන් යහපත් රටක්, යහපත් සමාජයක් ගොඩ නගා ගත හැකි ය.

## සාරාංශය

අදක්ෂ, අදූරදර්ශී පාලනය නිසා රටක ආර්ථිකය පිරිහී සදාචාරය බිඳ වැටෙන බව හා ඒ සේ නො වීමෙන් සමෘද්ධිමත්, සදාචාරවත් රටක් ගොඩ නැගෙන බවත්, ඒ සඳහා අගනා උපදෙස් බෞද්ධ ඉගැන්වීම්වල අන්තර්ගත වන බවත් මෙම පාඩමෙහි ඇතුළත් වෙයි.

## ක්‍රියාකාරකම්

01. අදූරදර්ශී හා දූරදර්ශී පාලනයෙහි වෙනස දක්වෙන කරුණු තුන බැගින් වෙන වෙන ම ලියන්න.

02. යහපත් රාජ්‍ය පාලනයක් සඳහා උපයෝගී කරගත හැකි බෞද්ධ ඉගැන්වීම් දෙකක් ඇගයීමට ලක් කරන්න.

03. මෙම පාලන පිළිවෙත්වලින් මතුවන ආදර්ශ ලැයිස්තු ගත කර දක්වන්න.

## පැවරුම

01. ''සදාචාර සම්පන්න සමාජයක් සඳහා බෞද්ධ උපදෙස්'' යන මාතෘකාව යටතේ ඔබ ශිෂ්‍ය සමිතියේ කරන කථාවක පිටපත සකස් කරන්න.